**5 වන පිටෙන්**

වන්න විමලරත්න ආදීහු ප්‍රධානව Ceylon Student Association නම් සංගමයක් ආරම්භ කළ අතර එහි දිගුවක් ලෙස සැලකිය හැකි Sri Lankan Club නමින් ආරම්භ කළ සංවිධානය 80 දශකය මැද වන තුරාම මෙරට කලා හා සංස්කෘතික කටයුතු සඳහා කේන්ද්‍රයක් වූ සංගමයක් විය. පසුව ආචාර්ය උපාධිය හිමිකර ගත් දයාල් අබේසේකර තම වෘත්තීය ආයතනය වූ Swinburne College of Technology හි ඉඩකඩ ඉල්ලාගෙන කරු ලියනාරච්චි (පසුව ආචාර්ය) වැනි 70 දශකයේ අග භාගයේ සංක්‍රමණය වූ පිරිස් සමග මූලිකව කළ සිංහල අවුරුදු උත්සව වැඩසටහන් මගින් සංක්‍රමනික පවුල් හට තම කලා කුසලතා හෙලි දැක්වීමට අවස්ථා සැපයීය. Sril Lankan Club හි වැදගත්කම වන්නේ 1983 දී ශ්‍රී ලංකාවේ ජාතිවාදී කලබල වලින් පසු සිත් බිඳීම් සහ වෙන්වීම් ඇති වන තෙක්ම සිංහල දෙමළ ජන කොට්ඨාශ එක්වූ සංගමයක් වීමය. මුස්ලිම් බර්ගර් ආදී අනෙක් ජනකොටස් ද ඒ වටා විය.



1950 සහ 1960 දශකයේ Colombo Plan Scholars වැඩසටහන යටතේ පැමිණි බො-හෝ වුන්ට නැවත මව් රට කරා යෑමට සිදු වූ අතර 1970 දශකයේ සංක්‍රමනික නීති වෙනස් වනතුරුම ප්‍රජාව අතරින් පැන නැගියා වූ කලා කටයුතුවල දීර්ඝකාලීනව බලපවත්නා ප්‍රගතියක් නොවුනි. එබැවින්, රංගකලා ක්‍රියාකාරකම්හි ප්‍රබෝධයක් හටගන්නේ 1973 දී White Australia Policy ඉවත් වීමත් සහ 1975 දී Racial Discrimination Act සම්මත කරගැනීම ත් සමග ක්‍රමයෙන් වැඩි වූ සංක්‍රමනික ධාරාව නිසාය.

පසුගිය ලිපියේ ද සඳහන් කළ පරිදි නර්තන කණ්ඩායම් රාජ්‍ය සහ පෞද්ගලික සංගම් අනුග්‍රහ මත මුල් යුගයේදී මෙරට සංචාරය කරන ලදී. මෙරටට පැමිණි ප්‍රාන්ත කිහිපයකම රඟ දැක්වූ සහ පිළිගත් රංග උළෙලවල් සඳහා සහභාගි වූ චිත්‍රසේනයන් ගේ රංග කණ්ඩායම් 1963 දී සහ 1972 කළ සංචා-රයන් මේ අතර ප්‍රධානය. චිත්‍රසේනයන්ගේ ගේ මුල් සංචාරයේදී ඔහු කරදිය මුද්‍රා නාට්‍යය හෝ නළ දමයන්ති සහ මුද්‍රා නාට්‍යය ද්වයයෙන් එකක් සමග තවත් ජන නැටුම් අංග සහිත වූ රංග වැඩ සටහන් දෙකකින් එකක් ඉදිරිපත් කරන ලදී. දෙවෙන චාරිකාවේදී බෙර වාදන සහිත උඩරට සහ පහතරට නැටුම් සහ ජන නාට්‍ය ඇතුලත් ප්‍රසංග වැඩ සටහන් දෙකකින් එකක් ඉදිරිපත් කරන ලදී. ආචාර්ය කරු ලියනාරච්චි සමඟ රෝහණ කරුණාරත්න කළ සාකච්ඡාවේදී කරු ලියනාරච්චි මහතා සඳහන් කර තිබුනේ, 70 දශකයේ ්රසක බ්බන්බ කකමඉ හරහා ගෙන් වූ එවන් නැටුම් කණ්ඩායමක් Monash විශ්ව විද්‍යාලයේ Robert Blackwood ශාලාවේ පැවති රංගනයකදී, ඔහු සහ ආනන්ද ජයසිංහ, බිත්තියේ ගසනා යක් මූණක් නැටීමට ගන්නා මුහුනක් බවට පරිවර්තනය කර තමාගේම ශෛලියකින් යක් නැටුමක් නැටූ බවය.

1970 දශකයේ සිදුවූ මේ කුඩා ක්‍රියාකාරකම්, අද පවතින රංග ක්‍රියාකාරකම් සඳහා තැබූ මූලික පසුබිමය. එම රංග ක්‍රියාකාරකම් විමසිය යුත්තේ ඒ යුගයේ සිටි සංක්‍රමණික ප්‍රජාවේ සං-ස්කෘතිමය අවශ්‍යතා සහ සම්පත් පුද්ගලයන්ගේ ශක්‍යතා අනුවය.

(මතු සම්බන්ධයි)

**මෙම ලිපිය සඳහා ඇතැම් කරුණු සොයා ගැනීමේදී උපකාර කළ රත්නා ගුරුසිංහ මහත්මියටත්. උපා උපදාස මහතාටත්. රෝහණ කරුණාරත්න මහතාටත් විශේෂ ස්තූතිය හිමිවෙයි**

**Mariane Fernando**

**Member ACA & Counsellors Victoria Inc.**
**Trained by Transgender Victoria**

Offering counselling services for:

- Relationship
- Addiction
- Grief and loss
- Family
- Anger management
- Anxiety and stress

**First session free**

Medibank Private Health Fund rebates may be available

**9798 7005 or 0423 364 618**

**NAATI Translator**

Sinhalese/English

**සිංහල ඉංග්‍රීසි පරිවර්තන**

(Certificates/Documents for Visa matters)

**Nadie Kammallaweera**

Tel: 0481 179 189

Email: nadiekammallaweera@gmail.com

